ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 ජනවාරි 06 සඳුදා
06 වෙළුම - 09 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014



# ළමා ප්‍රදීපය

මිල රු 10/-



දෙව් වදනින් නිති පොහොසත් වූ
සමිඳු සවිය තුළ එකමුතු වූ

## සුබ නව වසරක් වේවා !

Photos By: ASHEN S. SENARATHNA SLC

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# එකිනෙකාට සංවේදී වන වසරක් උදා කර ගනිමු.

### ආදරණීය දුවේ පුතේ...

වසරක් ගෙවිලා තවත් අලුත් වසරක් උදා වෙලා. 2013 වසර දැන් අවසන්. 2014 වසර පටන් ගන්නේ පුංචි ඔබේ හදවත් හා මනස් වල දහසකුත් එකක් බලාපොරොත්තු ඇති කරලයි කියන එක රහසක් නොවේ. ඔබ නත්තල් නිවාඩුව බොහෝම බැතිබරව සැමරූ බව වැඩිහිටි කවුරුත් දන්නවා. ඉතාමත් උනන්දුවකින් ඔබ හැම කෙනෙක්ම නත්තල මංගල්‍යයට සම්බන්ධ වුනේ ඇතුලාන්ත හා බාහිර සියලු ක්‍රියාකාරකම් වලට හොඳ සූදානමකින් බව ගෙවී ගිය වසරේදී මනාව පැහැදිලි වුණා. නත්තලට කලින් මතක් කළා වගේම වැඩිහිටියන් ගේ බාහිර ලෝකය හැමදාම කථා කරන ඒකාකාරී පිළිවතින් බැහැරව හොඳ ආධ්‍යාත්මයකින් ඔබ ළමා ලෝකය සුන්දර කරවීම ගැන අපි හැම කෙනෙක්ම ඔබට ස්තූතිය පිරි නමන්න ඕනා.

ඉතිං දුවේ පුතේ, ඒ ඔබ ලබා ගත් ආධ්‍යාත්මික පන්නරය හා ධාර්මික ශක්තිය උදාවූ මේ නව වසර පුරාම ජ්වලිත ආකාරයෙන් ගෙන යන්නට හැම කෙනෙක්ම දැඩි උනන්දුවක් ගැනිම අත්‍යවශ්‍යයයි. ඔබ අලුත් පංතියකට පාසලේ පිය නගන්නේ අලුත් බලාපොරොත්තු හා සන්තෝෂය කරපින්නා ගෙනයි. ඒ අලුත් සිතිවිලි, ඒ අලුත් හැඟිම් හා ඒ අලුත් සූදානම වසර අවසන් වන තෙක්ම ඔබ ගෙන යා යුතුයි. ඒ සියලු ශක්තිය ඔබ ලබා ගන්නේ ජේසු සමිඳුන්ගේ දහම් ශක්තිය ජීවිතයෙන් ක්‍රම ක්‍රමයෙන් වැඩි වර්ධනය කර ගැනිම තුළයි යන්න හොඳට අවබෝධ කර ගන්නට ඕනා.

ආදර දුවේ පුතේ, අපිට වෙනස් වන්නට පුළුවන්, අපි වෙනස් වන්නට ඕනා. ඒ වෙනස ජීවිතයෙන් අපි පෙන්වන්න ඕනා වන්නේ වඩාත් යහපත් හිතකාමි ස්වරූපයක් තුළයි. ආත්මාර්ථය ඇති කරන අනවශ්‍ය තරඟයෙන් ඔබ ඉවත් වන්නට ඕනා. එකිනෙකා කෙරෙහි වෛර යක්, ඊර්ෂ්‍යාවක් ඔබ තුළ තිබෙන්නට බැහැ. වැඩිහිටි ගරුත්වය පිළිබඳව අලුතින් සිතන වසරක් බවට මෙම වසරත් පත් කර ගන්න. ගුරුවර ගුරුවරියනට ඔබ දක්වන ගරුත්වයේ හා ආදරයේ හැඟීම තවත් වර්ධනය කර ගන්න. මෙන්න බලන්න, ජීවිතයෙන් අපි වෙනස් වන හැටි ඒ වෙනස ආගමික ආකල්ප වලින් පුරවලා හොඳ ශික්ෂාකාමී මාර්ගයක් වෙත ගෙන යන හැටි. මේ සියල්ලම කතෝලික දරුවෙක් ජීවිතයෙන් ඉටු කළ යුතු, අත්දැකිය යුතු වටිනාකම් සම්බාරයක් කියන ඒක හොඳට මතකයට ගන්න.

වසරක ආරම්භයේදී ඇති කරවන බලාපොරොත්තු මේ ආකාරයෙන් යහ දැක්මෙන් පිරී පවතිනවා නම් ඒ ජීවිතයම දසත සුවඳ හමා පිපෙන විසිතුරු කුසුමක් වගේ. ඒ ජීවිත කුසුම ඔබ සතුයි. ඔබ උරුම කර ගන්නා ඒ සඳහම් යහ දැක්මේ ජීවිත සුවඳ වටිනාකම් වලින් පොහොණි කොට දසත බෙදද්දී ඔබ යහපත් කතෝලික දරුවෙක්, දැරියක් හැටියට වටිනා, අගනා පාඩමක් නිතැතින්ම වැඩිහිටි ලෝකයට මුදා හරින නිසා ඔබ දිහා බලන වැඩිහිටියන් පවා ජීවිත වෙනසකට මුල පුරාවී, අන්න ඒ පැවැත්මෙන් ඔබ මේ වසර ආරම්භ කරනවා නම් ඔබ ගැන මුළු මහත් සමාජයම ප්‍රීති වෙනවා, ආඩම්බර වෙනවා එහ කොටස් කරුවෙක් වන්නට ඔබට මේ නව වසරේ ලබාදෙවන ආරාධනාව ඉත සිතින් පිළිගන්න.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

**ගිය වසරේ නිර්මාණ එවූ සියළුම දූ පුතුන්ට අපි විශේෂයෙන්ම ස්තූතිය පල කරනවා. මේ වසරේත් වැඩි වැඩියෙන් නිර්මාණ එවන්නටත් ළමා ප්‍රදීපයේ පාඨක සමාජයට ඇතුළු වන්නටත් දූ පුතුන්ට අපි ඉතාමත් ආදරයෙන් ආරාධනා කරනවා.**

**එවනු ලැබූ සියළු සුබ පැතුම් වලටත් ඔබහට ළමා ප්‍රදීපයේ සියළුම දෙනා ස්තූතිය එල කරනවා.**

**සංස්කාරක**
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




## දේව ප්‍රසාද නිධාන

❖ **ප්‍ර:** දේව ජීවනය අප තුළ ඇති කිරීම හා වැඩි කිරීමට දෙවියන් වහන්සේ සපයා දුන් මාර්ග මොනවා ද?

**උ:** දේව ප්‍රසාද නිධාන සත ය.

❖ **ප්‍ර:** ඒ ප්‍රසාද නිධාන සත මොනවා ද?

**උ:**
1. ප්‍රසාද ස්නාපනය
2. අභිවෘධි ආලේපය
3. දිව්‍ය සත්ප්‍රසාදය
4. පාපොච්චාරණය
5. රෝගීන් ආලේප කිරීම
6. පූජාත්වරය
7. ආශීර්වාදකාරබන්ධනය යන මේවාය.

❖ **ප්‍ර:** ප්‍රසාද ස්නාපනය නම් කුමක් ද?

**උ:** ජන්ම පාපයෙන් හා කර්ම පාපයෙන් අප නිදොස් කරමින් දෙව් පියාණන්ගේ ද, ශුද්ධවූ සභාවේ ද දරුවන් වීමට වරම් දෙන දේව ප්‍රසාද නිධානය වන්නේ ය

❖ **ප්‍ර:** අභිවෘධි ආලේපය නම් කුමක් ද?

**උ:** සත්‍ය විශ්වාසයෙහි අප ස්ථිර කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ද, උන්වහන්සේගේ ප්‍රසාදයන්ද අපට දෙන දේව ප්‍රසාද නිධානය වන්නේ ය.

❖ **ප්‍ර:** දිව්‍ය සත්ප්‍රසාදය නම් කුමක් ද?

**උ:** තිරිඟු පූපය හා මිදිරස ප්‍රකාරයෙන් වැඩ සිටින ජේසු ස්වාමිදරුවන්ය.

❖ **ප්‍ර:** පාපොච්චාරණය නම් කුමක් ද?

**උ:** ප්‍රසාද ස්නාපනය ලැබූ පසු කළ පාප වලට දෙව් පියාණන්ගෙන් කමාව ලබා දෙන දේව ප්‍රසාද නිධානය වන්නේය.

❖ **ප්‍ර:** රෝගීන් ආලේප කිරීම නම් කුමක් ද?

**උ:** මරණාසන්නවූ රෝගාතුරයන් ඉතිරිවූ පාප දෝෂවලින් නිදහස් කොට ඔවුන්ගේ ආත්මයට ද ශරීරයට ද සැනසුම හා ශක්තිය දෙන දේව ප්‍රසාද නිධානය වන්නේය.

❖ **ප්‍ර:** පූජාත්වරය නම් කුමක් ද?

**උ:** දිව්‍ය පූජා යාගය සිදු කරන්නට ද, දේව ප්‍රසාද නිධාන දෙන්නට ද, දේව වාක්‍යය දේශනා කරන්නට ද බලය දෙන දේව ප්‍රසාද නිධානය වන්නේ ය.

❖ **ප්‍ර:** ආශීර්වාදකාර බන්ධනය නම් කුමක් ද?

**උ:** විවාහ තත්වයට පත් වන ස්ත්‍රී පුරුෂ දෙදෙනාට ධර්ම මාර්ගයෙහි පවතින්නට ද තම දරුවන් නිසි ලෙස නඩත්තු කරන්නට ද ආශීර්වාද සලසා දෙන දේව ප්‍රසාද නිධානය වන්නේ ය.

## පාපොච්චාරණය

❖ **ප්‍ර:** හොඳ පාපොච්චාරණයක් කිරීමට වුවමනා වන කරුණු මොනවා ද?

1. දේව පිහිට ඉල්ලා යාච්ඤා කර තමා කළ පවු සිහිකිරීම.
2. කළ පවු වලට පසුතැවිලි වීම.
3. මින් මතු පවු නොකිරීමට ඉටා ගැනීම.
4. බරපතල පවු එකක් වත් නොසඟවා පූජාප්‍රසාදි තුමාට කීම.
5. පූජාප්‍රසාදි තුමා නියම කරන දඬුවම් ඉටු කිරීම, යන මේවාය.

❖ **ප්‍ර:** කළ පාපවලට පසුතැවිලි විය යුත්තේ මක්නිසා ද?

1. ඒවායින් අනන්ත යහපතාණන් වන පියාණන්ට අනදර කළ නිසා ය.
2. ඒවා ජේසු ස්වාමිදරුවන්ගේ දුක් ගාවිනා වලට හේතු වූ නිසා ය.
3. ඒවායින් දේව උදහසට හේතු වී දේව දඬුවමට අප හිමිකාරයන් වන නිසාය.

❖ **ප්‍ර:** පසුතැවිලි වීම නැතිව හොඳ පාපොච්චාරණයක් කළ හැකි ද?

**උ:** පසුතැවිලි වීම නැතිව හොඳ පාපොච්චාරණයක් කළ නොහැකිය. පසුතැවිල්ලක් නැතිව පාපොච් චාරණය කිරීම ශුද්ධවූ දේ දූෂණය කිරීමකි.

# අද ළමා විය

“තැන තැන රවුමට ඉඳගෙන ඉඳහිට එබිකම් කර කර ලෙන්සු හංගන්න ළමුන් එක්රොක් වෙන්නා”
ඉහත සඳහන් ජනප්‍රිය ගී කොටස මතක් වුයේ අද ළමයා ගෙවන ජීවිතය දකින විටය. එනම් මේ මුළු ගීතෙන්ම කියැවෙන්නේ පෙර කල ළමුන් කළ සෙල්ලම් ගැනය. නමුත් අද ළමෝ එම කෙළි සෙල්ලම් මොනවාද කියාවත් නොදනිති. අද පුංචි පැටවුන් කුස තුළට පිවිසි තැන සිටම දෙමව්පියෝ ඔවුන්ට සුපිරි පෙර පාසල් හා අමතර පංතිද සොයති. ඔවුන් මෙලොව එළිය දැක සොඳුරුතම ළමාවියට කෙමෙන් කෙමෙන් පා ඔසවන විටම ටියුෂන් පංතිවලට රැගෙන යන්නේද විධිමත්ව පාසලට යාමට සිතාවත් නොමැති අවධියේය.

පුංචි පැටවුන්ට කෙළි සෙල්ලම් වැලි පොල්කටු තහනම්ය. පුංචි සුන්දර සමනල පැටවුන්ව කෙළි සෙල්ලමට යොමු කිරීම ඉතා අත්‍යවශ්‍යමය. එය ගිලිහී යන හෙයින් අද විධිමත් ලෙස පාසල තුළ පළමු පංතියේදී දරුවන්ට සෙල්ලම් ගෙය හඳුන්වා දෙයි.

අද මේ පුංචි කැකුළු සමාජයේ කෙතරම් අපචාර වලට ගොදුරු වන්නේද? අද ළමා වියේ පසුවන කිසිදු දරුවකු සතුටින් තම දිවියේ සුන්දරම කාලය ගතකරනවායයි සිතීමට නුපුළුවන සුන්දර ළමා විය අප දෙවිඳුන්ගෙන් ලත් මහඟු දායාදයකි. එය රැක ගැනීම අප දෙමව්පියන්ගේ පරම යුතුකම වන්නේ ය.

**තෙරේස් ප්‍රනාන්දු** - කමරාගොඩ

# ඉටි පහනක් කතා කරයි



දෙව්මැදුරේ මුනිවරුන් පාමුල ඔබ පැතුම් පතන ආලෝකය මම වුනෙමි. ඔබ දැනුම වැඩුමට ලඟම සිට මම අඳුර පලවා හැරියෙමි. ආයුෂ කෙටිවුවත් කම් නැත මට , මගෙ යුතුකම මම ඔබ වෙනුවෙන් ඉටුකරමි. මගෙ සිරුරම ඔබ වෙනු
වෙන් පුද කරමි. යළි යළිත් මම
ඔබ වෙනුවෙන් පිදෙමි.
සියල්ලටම වඩා ඔබ මට වටිනා නිසා ඔබ වෙනුවෙන් නැතිවන්නෙමි. ඒ වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් ගැන මම නොසිතමි. මම දුබලයෙක්මි. ඔබමෙන් සවිමත් නොවෙමි.
එහෙත් මගේ යුතුකම මම දිවිහිමියෙන් ඉටුකරමි.
මගේ පොඩි කමට මම ගැන මම සතුටු වෙමි.

**කොල්වින් ඒ ප්‍රනාන්දු (ආචාර්ය මණ්ඩලය)**
සා. ලාසරස් දහම් පාසල - දෙමටපිටිය
(කටුනේරිය මීසම)

# දේව වචනය ප්‍රකාශ කරන්නට පසුබට වන්න එපා.....



විශේෂයෙන් දුවේ පුතේ, අල්තාරය පෙදෙසේ සැරිසරන්නට වරම් ලැබෙන්නේ ගරු පියතුමන්ලාට පැවිදි සොයුරියන්ට, සහෝදර තුමන්ලා, පූජා උදව් දරුවන්ට, සන්ක්‍රිස්තියන් මහතා වැනි අයට පමණයි. ඒ හැරුනාට දේව මෙහෙයක් තුළදී සුවිශේෂ කියවීම් තේමාව , විශ්වාසකයන්ගේ යැදුම් , විශේෂ යාච්ඤා කියවන අයවලුන්ට පමණයි. ඒ විශේෂ වරම ලැබෙන්නේ. එය දෙවියන් වහන්සේ ඔබලාට දීලා තියෙන විශේෂ වරප්‍රසාදයක්, තිළිණයක්, යම්කිසි අවස්ථාවකදී. දේව වාක්‍යයක් කියවීමට, ප්‍රසිද්ධියේ යාච්ඤාවක් කරනට නායකත්වය දීමට ඔබව තෝරාගත්තොත් මොනම හේතුවක් නිසාවත් ඒ මහඟු අවස්ථාව මඟ හරින්නට වෙරදරන්නට එපා. ගායනා හවුලට එක්වීම, පූජාවට උදව්වීම, කියවීම් වලට සහභාගී වීම දහම් දිවියතුළ ඔබ සැමට ලැබෙන විශේෂ වරප්‍රසාදයක්. ඒ සැම තේරීමක්ම පියතුමා මගින් සිස්ටර්ලා මගින් , දහම් ගුරු වර ගුරුවරියන් මගින් සිදුකෙරුනත් එවන් තේරීම සිදුවන්නේ දෙවියන් වහන්සේ වෙතින් බව සිහියට තබාගන්න. එතුළින් ඔබ සැමට සමාජයේ විවිධ පැතිකඩ ඔස්සේ ජනසමූහයක් ඉදිරිපිටදී අභීතව ප්‍රසිද්ධ දේශනා , වාද විවාද කරනට සමාජයේ නායකත්වයන් ලැබගන්නටද විශේෂ පන්නරයක් වනවා නොඅනුමානය. ඉතින් දයාබර දුවේ පුතේ, ඔබට ලැබෙන සැම හොඳ දෙයකින්ම නිසි ප්‍රයෝජන ගන්නට පැකිලෙන්න එපා. යහපත් සැම ක්‍රියාවකදීම එයට එඩිතරව මුහුණ දීමට ඉදිරිපත් වන්නට වෙරදන්න. අනාගත දිවිය තුළ නායකත්වය ගන්නට, නායකත්වය කරා ගමන් කරන්නට එය මහගු පිටිවහලක් වේවි. දෙවියන් වහන්සේ තුළ දිවි ගෙවන ඔබලා වැනි සුන්දර දරුවන්ට ‘බැහැයි කියලා දෙයක් නැති බව’’ සිත් තුළ ධාරණය කරගන්න.

**එම්. ජෝ.පාරිස් මාමා**
වැලිවිට

# අප දිවියේ ආලෝකය



ජීවයද දුනි මවා අප සැමට
ආලෝකයද ඔබමයි, සැමදා අපට
වහල් වූ දා අප, සැම අඳුරකට
පහන් ටැඹක් වුනි ඔබ අප සැමට

**නිපුන් සංජන දිසානායක**
9 ශ්‍රේණිය
ශා. සෙබස්තියන් දහම් පාසල
බංගදෙනිය

# කැඳවීම



ආදර ජේසුනි
දහසක් අතරින් ඔබ,
කැඳවන්නන් තෝරා ගනු
ලබද්දී
දුක සිතුනි මා හට,
මා සුදුසු ද නැති ද කියා,
නමුත් යම් දිනක , ඔබ
මා කැඳවයි කියා,
සිතුනි මා හට විටකදී
එම නිසා මා,
ඔබ තුළ සදාරැඳී
සිටින්නෙමි,
විශ්වාසයෙන් සැමද
කෙදිනක හෝ මා කැඳවන තුරා,
බලා සිටින්නෙමි මා සදා

**සම්පත් නෙතුපුල් ලංකා**
10 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල - තරාල මිසම

# ළමා සිතිවිලි



සමන් පිච්ච මල් සුවඳයි - පුංචි ළමෝ හරිම හොඳයි
සමන් පිච්ච මල් වාගේ අපි - ජේසු ළඟට කිට්ටු වෙමු

**ඈන් ලක්ෂිමා සෙව්මිණි**
4 ශ්‍රේණිය
සාන්ත ජුඩ් විදුහල - කුරණ

# ළමා කාලය



වෙල් ඉපනැලි වල දුව පැන හාවකු සේ
මවගේ තුරුලේ වෙළී සිටියේ මීයකු සේ
දඟ වැඩ කෙරුවේ මා දින සිතූ සේ
මතකෙට නැගේ නැවතත් පෙර දින සේ

ළමා කාලය ගෙවුනේ විදුලිය වගේ
සැමදා නැතේ මේ සැම දිනේ
අතීතය සැමදා සොඳුරුයි හැගේ
මතකෙට නැගෙද්දී කඳුළද නැගේ

**මලීෂා දිව්‍යාංජලි පෙරේරා**
9 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දෙව්මැඳුර - කිරාගාර (ගොනවිල මිසම)

# මනරම් දිය ඇල්ල



බිඳු බිඳු සැදී එක්වී දිය බිංදු සැදී
රැලි රැලි ගැසී එක්වී දිය රැල්ල සැදී
ඇලි ඇලි සැදී එක්වී දිය ඇල්ල සැදී
ගඟු ගඟු ගැසී එක්වී දිය ගඟක් සැදී

ගලා ඇදුනු මේ ජල බිඳු ඇල්ලක් සදා
රූරා ඇදුනු මේ ජල රළ දොලක් සදා
කඩා ඇදුනු මේ ජල ගඟ ගඟක් සදා
වේගෙන් ඇදී ජල දහරක් මුහුදක් සදා

**තිවංක ඉමේෂ් මෙන්ඩිස්**
10 ශ්‍රේණිය
කළුතර කටුකුරුන්ද දහම් පාසල (කළමුල්ල මිසම)

# මාසික සිතිවිල්ල





මාසික
සිතිවිල්ල

"දෙසැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

**සේයා**
**ටෝනි නිශාන්ත ප්‍රනාන්දු**

**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

## හලාවත පදවිය



කෝට්ටපිටිය සාන්ත අන්තෝනි දහම් පාසලේ දරු දැරියෝ 21 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. දේව මෙහෙය කෝට්ටපිටිය මීසම් සේවක ගරු ක්‍රිස්ට් පෙරේරා , මීසම් සහයක ගරු ප්‍රසන් ගෝමස් යන පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ගරු පියතුමන්ලා ළමුන් පුහුණු කළ දහම් ගුරු මැණිවරුන් සමග දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ දරුවන් සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු. **ලලිත් නවරත්න**



## කුරුණෑගල පදවිය




මල්පිටිය මීසමට අයත් උඩුපිටිය ශාන්ත ප්‍රැන්සිස් සේවියර් දේවස්ථානයේ ළමුන් 8ක් පසුගියදා ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීය. මීසම් සේවක ගරු මොන්ටි පෙරේරා පියතුමන් සමග දූ දරුවන් සේයාරුවකට පෙනී සිටි අයුරු.

**බී.කේ.ටී. රෙජිනෝල්ඩ්**

## බදුල්ල පදවිය

බදුල්ල ශා. මරියා ආසන දෙව්මැඳුරේ ළමෝ 26 ක් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. මීසම් සේවක ගරු ප්‍රියලාල් සහයක ගරු රොබට්ජේකබ් පියතුමන්ලා සමග දිව බොදුන් ලැබූ දූ දරුවන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**



## සුදතුම් වරම් ලැබීම





අනුරාධපුර පදවියට අයත් පදවිය මීසමේ සදසරණ දේව මාතා දෙව්මැඳුරේ ළමයි 17 ක් පසුගියදා අනුරාධපුර රදගුරු අති උතුම් නෝබට් අන්ද්‍රාදි හිමිපාණන් අතින් අභිෂේඩ ආලේපය ප්‍රසාද නිධානය ලබා ගත්හ. මීසම් සේවක ගරු කැලුම් ඩයස් (නි.ම.නි.) පියතුමන්ගේ මග පෙන්වීම යටතේ ගරු පැවිදි සොයුරියන් ආචාර්ය මඩුල්ලේ සහයෝගයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරිණි.

**රුවන් කුමාර**




# නොනිමි සෙනෙහස

"අනේ අම්මේ .... නංගීව ගෙනියන්න දෙන්න එපා නංගි නැතුව කොහොමද අපි ඉන්නේ . මට බැහැ නංගි නැතුව ඉන්න. මට නංගි ඕනා අම්මේ...."
"අඬන්නේ නැතුව ඉඳපන් පුතේ, නංගිට යන්න දියන්. ඒකිගේ අනාගතේ හරියයිනේ අපි එනවනේ දුවව බලන්න."
"අපි යන් දුව. මම දුවට ලොකු චොක්ලට් එකක් අරන් දෙන්නම්." එසේ කියමින් නංගි කාරය තුළට රැගෙන ගියාය. ඊට පස්සේ ගෙදර තනි වුණේ මමයි අම්මයි විතරයි. නතිඅපි දෙන්නා කොහොම හරි එදා වේල හොයාගෙන කාලා ජීවත් වුනා.

ඉගෙන ගන්න කියලා දහසක් බාධක මැද ගියේ ගමේ ස්කෝලෙට . අඳින්න කියලා තිබුනේ එක කලිසමයි ෂර්ට් එකයි. පොත් අරන් යන්න බෑග් එකක් වත් තිබුනේ නැහැ. පොත් ටික අරන් ගියෙත් අම්මා වියපු පන් බෑග් එකේ. ඔහොම තමයි අම්මයි මමයි ජීවත් වුනේ, මම ස්කෝලෙ ගිහින් ඇවිත් හවස යනවා පන් කපන්න. පන් කපන් ඇවිත් අම්මට දුන්නම පැදුරු , වට්ටි , පන් බෑග් වියනවා. අම්මා ඒ අතින් ගොඩක් ලස්සනට වියන්න පුරුදු වෙලා හිටියා.

ඒවා වියලා හැමදාම ඉරිදා පොළට අරන් ගිහින් විකුණලා ඒ ලැබෙන පොඩි මුදලෙන් තමයි අපි වේලක් කන්න මොනවා හරි හොයා ගත්තේ. ස්කෝලේ ගිහින් ඇවිත් සමහර දවස් වලට පන් කපන්න කෑම ටිකක්වත් නොකා, වතුර හරි තේ හරි බීලා යන්නේ. එහෙම වෙන්නේ එදාට උයන්න මොනවත් අම්මට හොයා ගන්න බැරුව ගිය දාට. එදාට කොච්චර බඩගිනි දැනුනත් අම්මට කිව්වේ නැහැ. අම්මේ බඩගිනියි කියලා එහෙම කිව්වේ නැත්තේ, කිව්වා කියලා අම්මට මුකුත් කරන්න බැරි බව මම දන්න නිසා. දිනෙන් දින ගත වෙන්න ගත වෙන්න අපිට නංගිගේ මතකය විතරයි ඉතුරු වෙලා තිබුනේ.

ඔය අතරතුරේ මගේ ශිෂ්‍යත්ව විභාගේ ප්‍රතිඵල ආවේ මට කොළඹ ස්කෝලෙකට යන්න අවස්ථාවක් උදා කරගෙන අම්මත් ගොඩක් සතුටු වුනා. "මම හිතුවා මගේ පුතා ඉහළින්ම පාස් වෙයි කියලා" සතුටු වැඩි කමට අම්මාගේ මුවින් පිට වුනේ එපමණයි. දවසින් දවස ගත වුනා පාසල් නිවාඩුව ඉවර වී මම කොළඹ ස්කෝලෙට යන දවස උදා වුවා. "මගේ පුතාට දෙවි පිහිටයි. ගිහින් පරිස්සමින් ඉඳපන් පුතේ" මම අම්මට දණ ගහලා වඳිද්දී අම්මා එසේ පැවසුවේ ඇස් දෙකේ කඳුළු කැට හංගා ගෙනය. කාලය ක්‍රම ක්‍රමයෙන් ගත විය. දිනක් අම්මාත් මමත් නංගි සිටින ගෙදරට ගියේ නංගි සමඟ කතා කිරීමේ දැඩි ආශාවෙනි. අප එහි ගොස් ටික වේලාවකට පසු ඒ නෝනා මහත්තයලා අපට කීවේ ආයේ එහෙ නොඑන ලෙසයි. එසේ කීවේ නංගීගේ ජීවිතයෙන් අපව අමතක කර දැමීමටය.

ඒ කොළඹ මහත්තයලට ඕන වුනේ නංගි ඔවුන්ගේ ම දරුවකු බව නංගීට පෙන්වීමටය. මා පාසල් ගොස් මා සිටින ගෙදරට යනුයේ නංගී සිටින නිවස ද පසු කරමිනි. වෙනදා බස් රථයේ නැගී යන මම එදා එම නිවස ළඟින් යාමට අවශ්‍ය වූ නිසා පයින් ගියේ නංගීගේ සුදු මුහුණ ලබා ගැනීමට මා තුළ වූ දැඩි ආශාව නිසාය.

මා නංගී සිටින නිවස ළඟට යන විට නංගි සෙල්ලම් කරමින් සිටන අයුරු මම දුටුවෙමි. ඉන් පසු මම ගේට්ටුව ළඟට වී ටික වේලාවක් නංගි දෙස බලා සිටියෙමි. මා දුටු නංගී, "මමී කවුද ඇවිල්ලා ගේට් එක ලඟ ඉන්නවා. මොනවාහරි ඉල්ලා ගන්නද දන්නේ නැහැ. බලන්නකෝ" "සෝමා ... බලන්න කවුද ඉන්නේ කියලා ඔය ඉල්ලන දෙයක් දීලා යවන්න" එසේ කියාගෙන නංගීව හදා ගැනීමට කියා අපෙන් අරගෙන ගිය නෝනා එළියට බැස්සා ඇය මා දැක විශ්මයට පත් වූ අයුරු මම දුටුවෙමි. "අපි කියලා තියෙනවා නේද මෙහේ එන්න එපා කියලා. ඇයි ආවේ දැන් දුවට ඔයාලව අමතක වෙලා ඉවරයි. ඒ ඔයාගේ නංගි නෙමෙයි. අපේ සුදු දුව. කරුණාකරලා අපිට කරදරයක් නොවී යන්න". ඇය එසේ පවසද්දී මගේ ඇස් දෙකෙන් කඳුළු කැට කඩා වැටුණේ මටවත් නොදැනීම ය.

**මධුෂිකා ලක්ෂානි විජේරත්න**
**11 ශ්‍රේණිය**

**උපුටා ගැනීම :- අලගොල්ලෑව සා. අන්තෝනි මහ විදුහලේ සිංහල භාෂා අංශය මගින් ප්‍රකාශයට පත් කළ " සිප්සර - 2013" නිර්මාණ සංග්‍රහයෙනි.**

**ඉතිරිය 10 පිටුවේ**

# ලෝක වාර් ලියන නත්

**නත්තල හා බැඳි විවිධ චාරිත්‍ර වාරිත්‍රයන් තෙවන සහස්‍රකයේ 21 වැනි සියවසේදී අපූරු හැඩතලයන් මවමින් සිටී. මේ අතර නත්තල් සීයා හෙවි සාන්ත නිකලස්තුමා හා බැඳි අපූරු සිදුවීම් රැසක් ඇත.**



වැඩිම නත්තල් සීයා වරුන් එක්වී

නත්තල් සමයට පෙරාතුව කුඩා දරු දැරියෝ නත්තල් සීයාට ලියුම් ලියති. ලෝකයේ දරුවන් විසින් නත්තල් සීයාට ලියන ලද දිගම ලියුම ගැන වාර්තා වන්නේ රුමේනියාවෙනි. රුමේනියාවේ බ්‍රාසෝම් නගරයේ වයස අවුරුදු 8-14 දරු දැරියෝ පුරා දින නමයක් තිස්සේ අඩි 1357.61 දිග ලියුමක් ලියූහ. මේ ලියුමෙන් දරු දැරියන් ඉල්ලා සිටියේ තම තමන්ට අවශ්‍ය පෞද්ගලික තෑගිබෝග නොවීම සුවිශේෂි කරුණකි. මේ දරුදැරියන් උස්මහත් වී වැඩිහිටියන් වන තුරු කැලෑ විනාශකර දැමීම වළක්වා සොබාදහම රැකදී පරිසරය සුරැකීමට නත්තල් සීයාට ඔවුහු ආයාචනා කළහ.

මේ සමූහික ක්‍රියාව මගින් දරුදැරියන් නත්තල් සීයාට ලියුම් ලිවීමට භාවිත කරන කඩදාසි විශාල ප්‍රමාණයක් අඩුකර ගත් අතර ලෝක වාර්තාව පිහිටුවීමෙන් පසු මේ හසුන ප්‍රදර්ශනය කර එහි දර්ශන අනාගතයට සුරක්ෂිතව තබා ඇති අතර ඒ සඳහා යොදාගත් කඩදාසි ප්‍රතිචක්‍රියකරණය කර නැවත අභ්‍යාස පොත් තැනීමට උපයෝගී කරගත්හ. ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙස්ට් පෝර්ට් නගරයේ පුද්ගලයන් 502 දෙනෙකු එකම කණ්ඩායමක් ලෙස ගොනුවී කරොල් ගීත ගායනා කරමින් ගෙයින් ගෙට යමින් ලෝකවාර්තාවක් පිහිටුවා ඇත. මේ කණ්ඩායම් නිවාස 14 කට යමින් කැරොල් ගී ගයා තිබේ. ගිනස් වාර්තා පොතට අනුව දකුණු කොරියාවේ යොන් මියුන්ග් බෝ පදනමේ පුද්ගලයන් 15,111 දෙනෙක් එකට කැරොල් ගීත ගායනා කර වාර්තාවක් පිහිට වූහ.

නත්තල් සමයේ ගිනිකෙළිවලින් නම් අඩුවක් නැත. එංගලන්තයේ බර්මින්හැම් ප්‍රදේශයේ දිගම නත්තල් ගිනිකෙළි දම්වැල සංවිධානය කර ගිනස් වාර්තාවක් පිහිටුවා ඇත. මේ සඳහා කාර්යාලීය සේවකයන්, අවන්හල් කාර්ය මණ්ඩල, පදිකයන් මෙන්ම සාප්පු සවාරියේ යන පිරිස් එක්වූහ. පුද්ගලයන් 749 දෙනෙක් මේ සඳහා සහභාගී වූහ.




ලොව කුඩාම නත්තල් සුබ පැතුම්

වර්ෂ 1911 දී අයර්ලන්තයේ දස හැවිරිදි හන්නා හා සත් හැවිරිදි ප්‍රෙඩ්විසින් නත්තල් සීයාට ලියන ලද ලියුමක් ජෝන් බර්න් විසින් සොයාගෙන තිබේ. වර්ෂ 1992 දී ජෝන්බර්න් සිය නිවසේ මධ්‍යම කොටසේ උණුසුම ගිනි උඳුන අලුත්වැඩියා කිරිමේදී එහි චිමිනියේ රැඳී තිබී මේ හසුන ලැබී ඇත. සිහිවටනයක් ලෙස එය සුරැකිව තබාගත් අතර එම ලිපියේ නිරවද්‍යභාවය ගන්නා සේ පුතකු වන වික්ටර් බාර්ට්ලම් සනාථ කර තිබේ. වර්ෂ 1900 දී උපත ලද ගන්නා නත්තල් සීයාට ලියූ ලියුමෙන් ඉල්ලා ඇත්තේ බෝනික්කෙකි. ඇය 1978 දී මියගියාය.




නත්තල් සීයාට ලියු පැරණිම ලියුම

ලෝකයේ කුඩාම නත්තල් සුබපැතුම් පත නිර්මාණය නිරීමෙන් එක්සත් රාජධානියේ ග්ලාස්ගෝ සරසවිය ලෝක වාර්තාවක් පිහිටුවා තිබේ. මේ නත්තල් පත් 8276 ක් කුඩා ප්‍රමාණයේ මුද්දරයක් මත තැබිය හැකි තරමට මෙය කුඩාය. මයික්‍රෝමීටර් 200 පළල, මයිකෝ මීටර් 290 උසැති මේ සුවිශේෂි නත්තල් සුබපැතුම් පත කථිකාචාර්ය ඩේවිඩ් කසිස්ට නිර්මාණයකි. මිනිස් කෙස්ගසක් පළල ඒ 5 ප්‍රමාණයේ නත්තල් පතක් වැසීමට ලක්ෂ 5 කට වැඩි ප්‍රමාණයක් වැයවෙත මේ සුබපැතුම් පත නිෂ්පාදනයට වැයවී ඇත්තේ පැය භාගයක් පමණි.



සීතලහිමේ ලොකුම නත්තල් සීයා මූර්තිය

# තා අලුතෙන් තල් විසිතුරු




පත

ජේසු බිළිඳු උපතේදී එඩේරුන්ට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එංගලන්තයේ මිඩ්සොමර් නෝටස්හි ජීවමාන ගවලෙනක් ජීව ගන්වන්නට එඩේරුන් මෙන් සැරසුණු බැතිමතුන් 788 දෙනෙක් සහභාගී වූහ. ඒ අනුව ලොව ජීවමාන කිතු උපත පිළිබිඹු කරන්නට එක්රොක් වූ වැඩිම පිරිසක් ලෙස මෙය වාර්තාගතවී ඇත. මීට පෙර ඉතාලියේ ජීවමාන ගවලෙනක් සඳහා පුද්ගලයන් 567 දෙනෙක් සහභාගී වූහ. මේ අතර ගිනස් වාර්තාවලට අනුව ලෝකයේ විශාලතම ගවලෙන ලෙස වාර්තාගතවී ඇත්තේ 1999 දී මෙක්සිකෝවේ සර්ජියෝ රොඩ්ගුවස් විසින් තනත ලද යෝධ ගව ලෙනයි.ගැල්වනයිස් තහඩු, යකඩ බට, නළ යොදා තැනූ මෙහි රජතුන්කට්ටුවේ එක් රජකුගේ උස අඩි 15 1/2 කි.



නත්තල් සීයාට ලියන දිගම ලියුම



ලොව කිතුනු කලා අසිරිය

ප්‍රංශයේ පැරිස් නුවර දී පැට්රික් රොජර් විසින් අඩි 32 ක් උස ටොන් හතරක් බරැති ලෝකයේ වඩාත්ම උස චොකලට් වලින් තැනූ නත්තල් ගස නිර්මාණය කරමින් ලෝක වාර්තාවක් පිහිටුවා තිබේ.

ප්‍රංශයේ ඉතාමත් ප්‍රකට චොකලට් නිෂ්පාදකයකු වන ඔහුට මේ නිර්මාණය සඳහා මාසකට වැඩි කාලයක් ගතවී ඇති අතර ඩොලර් 45,000 ක් වටිනා චොකලට් භාවිතා කර ඇති මෙහි යොදාගත් චොකලට් වලින් තුනෙන් දෙකක්ම කළු පැහැති තිත්ත රසැති චොකලට් වේ. 2010 දී කළ මේ නිර්මාණය අලෙවි කිරීමෙන් ලද මුදල් ඔහු දයාසේවා සඳහා පරිත්‍යාග කළේය.ලෝකයේ ඉපැරණිතම කෘත්‍රිම නත්තල් ගස ලෙස බුහුමන් ලබන්නේ වසර 124 ක ඉතිහාසයකට උරුම හිමිකම් කියන එංගලන්තයේ පෝල් පාකර් සතුව පවත්නා මේ නත්තල් ගසයි. මීට වසර 124 කට පෙර පෝල්ගේ මුතුන් මිත්තන් පැන්ස හයකට මිලදී ගත් මේ නත්තල් ගස මේ වන විට පවුම් දහසක් හෙවත් ඩොලර් 1585 ක වටිනාකමක් ගනී. වාර්ෂිකව සිය නිවසේ ඉදිකරන නත්තල් ගස ලෙස පරම්පරාවෙන් උරුම වූ මේ නත්තල් ගස යොදාගන්නට පෝල් පාකර් අමතක කරන්නෑ.



චොකලට් වලින් තැනූ නත්තල් ගස

ලෝකයේ විශාලතම හා අපූර්වතම නත්තල් ගස ලෙස වාර්තා පිහිටුවා ඇත්තේ බ්‍රසීලයේ රියෝද ජැනෙයිරෝ හි ඉදිවූ මේ නත්තල් ගසය. අඩි 278 ක් උසැති මේ නත්තල් ගස ආලෝකවත් කිරීමට විදුලි බුබුළු ලක්ෂ 29 ක් උපයෝගී කරගෙන ඇති අතර එය හැඩවැඩ ගන්වන්නට නත්තල් සැරසිලි 1600 ක් යොදාගෙන තිබේ. කිලෝමීටර් 52 ක් දිගැති විදුලි කම්බි ප්‍රමාණයක් මෙය ආලෝක ගන්වන්නට උපයෝගී කරගෙන ඇති අතර මේ නත්තල් ගසටම ආවේනික සංගීත රටාවන් වාදනය වේ.

හිම වැටෙන මේ සීතල නත්තල් කාලයේ ලොව විශාලතම අයිස්වලින් තැනූ නත්තල් සීයා ඉදිකර ඇත්තේ චීනයේය. අඩි 525 ක් දිග අඩි 79 ක් උසැති මේ නත්තල් සීයාගේ රැවුල සහ හිස්වැසුම කදිමට නිරූපණය කර ඇත. කෘතිම හිම කියුබික් මීටර් 4000 ක් මේ සඳහා යොදාගැනීමට මූර්ති ශිල්පීන්ට සිදුවිය. විශේෂයෙන් පාරිසරික උෂ්ණත්වය ඉහළ ගියහොත් මේ නිර්මාණය දියවී යාමේ අභියෝගය මත මෙය නිර්මාණය කිරීම ඉතාම අසීරු කටයුත්තක් වූ නමුත් එය ජයගැනීමට අවසානයේදී ඔවුහු සමත් වූහ.

චීනයේ සීතල අධිකතම හර්බින්හි සෙල්සියස් අංශක -35ක් වූ උෂ්ණත්වයක අත පය ගල්වන තරමේ සීතලක් මැද මේ අපූරු නිර්මාණය නිමවන්නට ඔවුහු සමත් වූහ. පෘතුගාලයේ පෝර්ටෝ නගරයට එක්රොක්වූ 14,200 ක් වූ නත්තල් සීයා ලෝකයේ එක්තැනකට එක්රොක්වූ වැඩිම නත්තල් සීයාවරු බවට පත්ව වාර්තාවක් පිහිටු වූහ. හුදෙක්ම මේ ලෝක වාර්තාව සඳහාම පමණක් ඔවුන් එක්රැස් නොවූ අතර දයාසේවාවන් සඳහා ජනතාවගේ ආධාර එකතු කරන්නට ඔවුහු පෙළ ගැසුනහ. මේ අවස්ථාවට එක්වීමට 17,400 ක් එකඟ වී සිටියද අවසානයේ එක්වූයේ 14,200ක් පමණි. කෙසේ වෙතත් එය නව ලෝක වාර්තාවකි.

ශිරාන් මෛත්‍රි

**07 පිටුවෙන්**

මම එතනින් ඉවත්ව ගියේ ලොකු දුකක් සිත තුළ සඟවාගෙනය. සැමදාම දඹුල්ලේ සිට කොළඹට පාසල් යා නොහැකි නිසා මම සිටියේ අපිට ගොඩක් උදව් කරන තාත්තව හොඳට හඳුනන අංකල් කෙනෙකුගේ ගෙදරක ය. ඔහු නමින් පෙරේරා ය. පෙරේරා අංකල් හා ආන්ටි මට ගොඩක් ආදරයෙන් සලකනුයේ ඔවුන්ගේම දරුවකු ලෙසය. තාත්තා වෙසක් උත්සවයක තොරණක් ගහන්න ගිහින් කරන්ට් එක වැදී මිය යාමෙන් පසු ගෙදර ඉතිරි වූයේ අපි දෙන්නයි නංගියි විතරයි.

නංගීද කොළඹට ගිය පසු අම්මයි මමයි දෙන්නා ජීවත් වෙන්න ගොඩක් දුක් වින්දා. ඒත් දැන් ගෙදර තනිවෙලා ඉන්නේ අපේ අහිංසක අම්මා විතරයි. "ඇයි සුනිල් පුතා ඔයා අද ගෙදර එන්න පරක්කු වුනේ". ඇන්ටි මගෙන් ඇසුවේ මා වෙනදාට වඩා බොහෝ සෙයින් ප්‍රමාද වූ නිසාය.

මට මෙච්චර ආදරේ කරන ඇන්ටිට බොරුවක් කියන්න තරම් මට හිතක් නොවීය. මම ඇත්ත කීවෙමි. සිදු වූ සියළුම දේ එකක් නෑරම කීවෙමි. "ඇයි පුතේ ඔයා එහේ ගියේ එන්න එපා කියලා තියෙද්දීත්" නංගිගේ අනාගතේ ගැන හිතලවත් ඔයා හිත හදාගන්න. අම්මා එදා නංගිව ඒ මහත්තයලට දුන්නේ තාත්තා නැතුව අම්මට සියළුම දේ කරන්න බැරි නිසානේ. කමක් නැහැ පුතේ හිත හදාගන්න. පුතා ගිහින් ඇඳුම් මාරු කරලා කෑම කන්න. දැන් බඩගිනිත් ඇතිනේ.

එලෙස කාලය ගෙවුණි මම නැවත දඹුල්ලේ අපේ කුඩා නිවස කරා ගියේ රත්තරන් අම්මාගේ අතින් උයන රසබත් කටක් කෑමට ය. අම්මා මාව දුටු පසු මගේ හුස්ම ඉහළට ඇදුනේ ඇගේ ශරීරය දුටු විටය. ඇය ගොඩක් කෙට්ටු වී ඇති බව මට දැනුණි.

"අම්මා ලෙඩින් හිටිය ද අම්මේ " ඔය තරම් කෙට්ටු වෙලා තියෙන්නේ".

"ඒවායින් වැඩක් නැහැ. මගේ පුතේ," කියා අම්මා මා සැනසුවා ය.

මම මගේ අම්මත් සමඟ ඉතුරු කාලය ගත කළෙමි. මේ අතරතුර මට නංගීව හමු වීමේ ආශාවක් ඇතිවුණි. මම කොළඹ සිටින කාලයේ බොහෝ යහළුවන් සිටි නමුත් මගේ හොඳම මිතුරා වූයේ වසන්තය. මම අම්මට නංගීව හමු වීමට යන වග නොකියා වසන්තගේ ගෙදර එන බව කියා ගෙදරින් ආවේ මට නංගීව හම්බ වෙන්න තිබුන ආශාව නිසයි. "ඔන්න ඔහොම තමයි නංගි අපේ ජීවිත මෙච්චර කාලයක් ගෙවුනේ.

මට ඕනවෙලා තිබුනා නංගීට ඇත්ත කියන්න. කියලා නංගි අපේ කර ගන්න" "මේකද අයියේ එහෙනම් ඇත්ත. ඒක තමයි මම මගේ පොඩි කාලේ ෆොටෝ ඉල්ලනකොට ඒවා නැහැයි කියලා කිව්වේ."

"කෝ අයියේ අම්මා? වසන්ත අයියලාගේ ගෙදර ආවේ නැද්ද?"

නැහැ නංගි අම්මා දඹුල්ලේ අපේ ගෙදර නංගීට මතකද අපි හැමදාම නාන්න වැවට යනවා. ගිහින් වෙල් නියර දිගේ එනවා. එද්දි අඹ වෙරළු කකා ගෙදර එනවා. එතකොට අපේ ගෙදර තියන දිවුල් ගහ."නෑ අයියේ මට කිසි දෙයක් මතක නැහැ. නංගි ඔය දිවුල් ගහේ දිවුල් කන්න හරිම ආසයි. කමක් නැහැ නංගීට මතක නැහැනේ." "ඒක නෙමෙයි අයියේ මට අම්මව බලන්න ඕනි. මට මගේ අම්මා ගාවට යන්න ඕන."

"ඒත් නංගි ඔයා කොහොමද එන්නේ . ඒක ලොකු අමාරු වැඩක්."

"අයියා ඇත්තටම මගේ අයියා නම්, මාව අම්මා ගාවට ගෙනියන්න ඕනා." "නංගී අපි හදිසි වෙලා මේ වැඩ කරන්න හොඳ නැහැ." "අයියේ අනික දැන් මගේ මම්මි ඩැඩියි දෙන්නගෙන් එක්කෙනෙක්වත් මේ ලෝකේ නැහැ. එයාලා ඇ-ක්සිඩන්ට් එකකින් නැතිවුනා. අයියා විතරයි ගෙදර ඉන්නේ."

"හරි නංගි අපි කොහොම හරි ගෙදර යමු. හැබැයි තවත් ඉවසමු."

කාලය ක්‍රමයෙන් ගත විය සුනිල් නිතරම තම නැගණිය වන පවිත්‍රා හමු වීමට පැමිණියා ය. කාලය ගත වුයේ පවිත්‍රා ද ඇගේ අයියා ලෙස සලකන කුමාර ද සියළුම සත්‍ය දැනගැනීමෙන් ය. මුලින් කුමාර පවිත්‍රා ඇගේ මව වෙත ගෙනයාමට අකමැත්ත පල කළද, පසුව ඇයට ඇගේ නියම මව හා සහෝදරයා සිටින බව ඔහුට වැටහුනු පසු සියලුම දේ සමඟ ඇයව දඹුල්ලට ගොස් කුමාරම ඇරලුවේය. ඔහු කියා සිටියේ අවුරුදු ගණනක් එකට සිටි සහෝදරියව අමතක කරන්නට බැරි බවකි. එම නිසා පවිත්‍රාට ඔහුව බලන්නට එන ලෙස ඉල්ලා ඔහු ගියේය.

"මගේ අම්මා මට දැන් ඉන්නවානේ මට මොන දේ නොලැබුණත් මගේ අම්මා ඉන්න නිසා මට කිසිම සම්පතක් ඕන නැහැ."

"අපි මේ පුංචි ගෙදර සතුටින් ඉමු අම්මේ."

පවිත්‍රා එසේ කී විට ඇගේ මවගේ දෑසට කඳුළු ඉනුවේ ය. පවිත්‍රා කුමාර ව බැලීමට යාමට ද අමතක නොකළේය. මේ අතරතුර කුමාර ද සහෝදරිය නැති අඩුව පිරෙන්නටත් සිතා ඔහු විවාහයක් කර ගත්තේ ය.

පවිත්‍රා ද, සුනිල් ද, ඔවුන්ගේ මව වන කුසුමලතා ද තවමත් පුංචි කැදැල්ලෙහි සතුටින් ජීවත් වනු ඇත.

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 37

## රෙපරමාදු ආභාෂයෙන් බිහි වෙන නව චින්තන රටා

පසුගිය ලිපිය හා සබැඳේ

### II එංගලන්තයේ පියුරිටානු වාදය

පියුරිටානවාදීන් හා රජවරු අතර එංගලන්තයේ ඇතිවූ ඝට්ඨනය ඉතාමත් බියකරු එකක් විය. ක්‍රිස්තියානි සභාව පාලනය කිරීමට රජය ලබා තිබුණ අයිතියට පියුරිටන්වරු තදින්ම විරුද්ධ වූහ. එපමණක් නොව, ඒකාධිපති රාජ්‍ය පාලන ක්‍රමය දැන් යල් පැනපු එකක් බව ප්‍රකාශ කරමින් ඒ වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් බිහි කළ යුතුයැයි ඔවුන් තරයේ කියා සිටියහ. එම ව්‍යාපාරයේ ප්‍රතිඵලය දරුණු එකක් විය. 1649 දී පළමු චාර්ල්ස් රජතුමා ඝාතනය කරනු ලැබුණේ ය. එතැන් සිට 1660 දී ඔහුගේ පුත් දෙවෙනි චාර්ල්ස් නැවත රාජාසනයට පැමිණෙන තෙක් එනම් වසර 11 ක කාලයක් තුළ එංගලන්තයේ රජ කෙනෙක් නොසිටියේ ය. රජ කෙනෙකු නැවත පත්වූ විට එය තමන් ලත් මහා පරාජයක් සේ පියුරිටානුවාදීහු සැලකූහ. පියුරිටන් වාදීනට රට හැර යන්නට සිදුවූහ. වැඩි දෙනෙක් ඇමරිකාවට ගියහ. එංගලන්තය තුළ ''පියුරිටානු'' යන නාමය භාවිත කිරීම පවා තහනම් වෙන්නට විය.

සංවිධානයක් වශයෙන් පියුරිටානු වාදය එංගලන්තයෙන් තුරන් වූ නමුත් චින්තන රටාවක් වශයෙන් එය දිගටම රැකුණේ ය. එපමණක් නොව ජැන්සනිස්තවාදය තුළින් සේම පියුරිටන්වාදය තුළින්ද අතිශයින් වැදගත් සාහිත්‍ය කෘති සමූහයක් බිහි වෙන්නට විය. එංගලන්තයේ උසස්ම ගණයේ කාව්‍ය කෘතියක් වන ''නැතිවුන පාරාදීසය '' නිර්මාණය කළ ජෝන් මිල්ටන් ද ''මහමුකලාන මැදින්'' නැමති සංකේතාත්මක නවකථාව බිහි කළ ජෝන් බනියන් ද පියුරිටානුවාදීහු වූහ.

### III විද්‍යාත්මක දේවවාදය

රෙපරමාදු විප්ලවයේ ආභාෂයෙන් ප්‍රංශය තුළ ඇතිවූ ජැන්සනිස්ත වාදයට එංගලන්තය තුළ ඇතිවූ පියුරිටානු වාදයට අමතරව , ඒ රටවල් දෙකම එකසේ මුල් කර ගෙන තුන්වෙනි චින්තන රටාවක්ද බිහිවිය. එය හැඳින්වුයේ ඩෙයිසම් යනුවෙනි, සිංහලෙන් එය විද්‍යාත්මක දේව වාදය හෝ වඩා කෙටියෙන් විද්‍යා ආගම් වාදය සේ වුවද හැඳින්විය හැක්කකි. ''ඩෙයිසම්'' යන නම දෙවියෝ යන අර්ථය ඇති ඩෙයුස් යන වචනය මුල් කර ගෙන තැනුන එකකි. ඒ අනුව මෙම චින්තන හවුලේ සාමාජිකයෝ එක්තරා දේව ආකල්පයක් පිළිගත්හ. එහෙත් එය එක්තරා අපැහැදිලි අවිනිශ්චිත ස්වරූපයක එකක් විය. භෞතික විද්‍යාවන් හා නොගැටීම සඳහා දේව ආකල්පයේ එම අවිනිශ්චිත භාවය ඔවුන්ට වැදගත් විය.



ධර්ම ශාස්තෘවරයකු වශයෙන් මොව්හු ජේසු ක්‍රිස්තු තුමන් පිළිගත්හ. එහෙත් තම විද්‍යා චින්තනයට අනුකූලව මොව්හු එතුමන් සැලකුවේ යහපත් ගතිගුණවලින් යුත්ත වුවද සාමාන්‍ය මිනිසකු සේ පමණි. සභා ආකල්පය මොව්හු එහෙම පිටින්ම ප්‍රතික්ෂේප කළහ. එම නිසා ආයතනික ක්‍රමයේ කතෝලික සභාව හා රෙපරමාදු සභාව යන දෙකටම එකසේ තදින්ම විරුද්ධ වූහ. බයිබලයටද මොව්හු එතරම් විශේෂත්වයක් දැක්වූයේ නැත. ඔවුන් පැවසූ පරිදි බුද්ධිමතෙක් බයිබලයේ වචනවලටවත් බයිබලයේ ඉගැන්වීම්වලටවත් වහල් නොවිය යුතු ය මිනිසෙක් යටත් විය යුත්තේ සිය බුද්ධියට පමණි.

විද්‍යා ආගම නමින් හැඳින්වුන මෙම චින්තන රටාව ජැන්සෙනිස්ත වාදය හා පියුරිටාන වාදයට වඩා සම්ප්‍රදායානුකූල ක්‍රිස්තියානියෙන් ඈතට ගිය චින්තන රටාවක් සේ ඒ අනුව පෙනී යා යුතු ය. එසේ වීමට හේතුව එයට රෙපරමාදු විප්ලවයේ ආභාෂය පමණක් නොව බුද්ධිවාදයට මුල් තැනක් දුන් ග්‍රීක රෝම පුනරුදයේ ආභාෂයද එයට ලැබී තිබුණ නිසාය. මෙම ව්‍යාපාරය බුද්ධි ප්‍රබෝධය හා බුද්ධියේ යුගය යන නම්වලින්ද හඳුන්වනු ලැබුනේ එහෙයින් ය. මෙම විද්‍යා ආගම් වාදය වඩාත්ම ජනප්‍රිය වුනේ සමාජයේ ඉහළ පංතියට අයත් පුද්ගලයින් අතර ය. ආගම නුගත් ගැමි ජනයාට පමණක් අවශ්‍ය දෙයක් සේ දක්වමින් එය පාච්චලයට ලක් කිරීම උගත්කමේ ලක්ෂණයක් සේ ගැනුණේ ය. එංගලන්තයේ මෙම ව්‍යාපාරය අතිශයින් ප්‍රබල විය. එහෙත් ප්‍රංශයේ එය ඊටත් වඩා ප්‍රබල වුවා යැයි කිව හැක. ප්‍රථම ප්‍රංශ විශ්ව කෝෂය සකස් කරමින් සිටි වෝල්ටෙයාර් හා රූසෝ වැනි පඬිවරු එය ගැන බහුලව ලිවුහ. ඒ කාලයේ යුරෝපයේ හැම රටක්ම තම නවතම විලාසිතා ලබා ගත්තේ ප්‍රංශයෙන් ය මෙම යුගයේදී ප්‍රංශයෙන් ලබා ගත් ප්‍රධානතම විලාසිතාව වුයේ මෙම විද්‍යා ආගම්වාදය ය.

**ඉදිරියට .......**

**සංස්කාරක පියතුමන් විසිනි**



**අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා**

**ට්‍රෙවෝන් ශෙනන් රිංස්ලි**

06 ශ්‍රේණිය

මාරිස්ටෙල්ලා විදුහල - මීගමුව

**දේව අම්මා**

**සුපිපි ඈන්**

03 ශ්‍රේණිය

ශා. ජෝශප් දහම් පාසල - වෙන්නප්පුව





**භාග්‍යවත් ජුසේවාස් පියතුමා**

**ශානියා රොෂානි**

04 ශ්‍රේණිය

සිරිකුරුස විදුහල - ගම්පහ






**ශු. අන්තෝනි මුනිතුමා**

**ශෝභා සෙව්මිණි**

03 ශ්‍රේණිය

සා. අන්තෝනි ප්‍රාථමික බාලිකා විදුහල - මෝදර

**දයාවේ ජේසු**

**රුසිරු සාවින්ද**

07 ශ්‍රේණිය

ශා. ආනා දහම් පාසල - තලවිල





**සදාසරණ මෑණියෝ**

**සංදීප මල්ෂාන්**

07 ශ්‍රේණිය

සිරිහඳ දහම් පාසල

බොල්ලත - ගණේමුල්ල

# ශු. ජුවාම් අපෝස්තුළුතුමා



## සුදුවර චරිතයක් හඳුනාගනිමු

**මෙතුමා අපෝස්තුලුවරයෙකි. සුවිශේෂ කතුවරයෙකි. ඇරමයික් බසින් මෙතුමාගේ නාමයේ අර්ථය වන්නේ ''යාවේ දුන් තිලිණය යන්නයි.'' පියා සෙබදිය. මව සලෝමිය, ඇය දෙව් මව්ගේ ඉතා කිට්ටු ඥාතියකු විය. පාරම්පරිකව බෙත්සයිදා වැසියෙක් වුවද මුළු පවුලම වාසය කළේ කපර්නාවුම්හි ගලීලයේ මුහුද අසලය. ශු. ජේම්ස් තුමා මෙතුමාගේ සහෝදරයාය.**

ඉතා දක්ෂ ධීවරයෙකු වූ මෙතුමා, තම පියා වූ සෙබදිද, සොහොයුරු ජේම්ස්ද සමග ගලීල මුහුදෙහි මසුන් ඇල්ලීම තම රැකියාව කර ගත්තේය. තවද, පේදුරු යන අය සමගද ඉතා සහයෝගයෙන් කටයුතු කළ අයෙකි.



කිතු සමිඳුන් ජුවාම් සහ ජේම්ස් යන දෙසොහොයුරන් කැඳවීමට පෙර ඔව්හු ස්නාවක ජුවාම් තුමාගේ ගෝලයෝ වූහ. ස්වාමින් වහන්සේ වෙතට ඔවුන් යොමු කරන ලද්දේ ස්නාවක ජුවාම් තුමා විසින්මය. ජුවාම් තුමා එතුමාගේ සුවිශේෂ පොත සහ එළිදරව් පොත නිසා කීර්තියක් ලබයි. ඉතා පුද්ගලික කරුණු සැපයෙන එතුමාගේ සුවිශේෂයේ මහෝත්තම හා දිව්‍යමය කිතු සමිඳුන් උන්වහන්සේගේ මෙලොව ජීවිත සිද්ධින් තුළින් මවාපායි. එතුමාගේ සුවිශේෂයේ කිසිවිටක තම නම සඳහන් නොකරයි. එහෙත් ඒ වෙනුවට පෙනී සිටින්නේ ශ්‍රාවකයෙක් , අනෙක් ශ්‍රාවකයා උන්වහන්සේ ප්‍රේම කළ නැතැත්තා ක්‍රිස්තුන් වහන්සේගේ ඇලයෙහි හාන්සි වූ තැනැත්තා යන නම් වලිනි ස්ථිර වශයෙන් ජේසුස් වහන්සේව අනුගමනය කිරීමේ වාසනාව ඔවුනට උදාවුයේ මසුන් රාශියක් අසුවීමේ ප්‍රතිහාර්යයෙන් පසුවය. ''ගිගුරුමේ පුතුන්'' යනුවෙන් මේ සොහොයුරන් දෙදෙනා හැඳින්වුයේ ජේසු තුමන්මය. එහි අදහස ''ඉක්මනින් කිපෙන්නන්'' යන්නය. එම නම ඔවුනට ගැලපෙන බවට පහත සිද්ධින් සාක්ෂි දරයි. කිතු තුමන් නොපිළිගත් එතුමන්ට ආගන්තුක සත්කාර නොකළ සමරිතානුන් මත අහසින් ගිනි ඒමට ඉල්ලීම හා තවත් අවස්ථාවක ස්වාමින් වහන්සේගේ ශ්‍රාවක නොවන අයෙක් එතුමන්ගේ නාමයෙන් යකුන් දුරු කරද්දි තදින් උරණව කතා කිරීම වැනි අවස්ථා වලින් පැහැදිලිව සනාථ වේ.

ජේසු තුමන් ප්‍රේම කළ ගෝලයා හැටියට, ජයිරස්ගේ දුව මළවුන් ගෙන් නැගිටවීම , අන්‍යරුප විලාශ විම හා මල් උයනේ දුක් විදිම යන අවස්ථා තුනම දැකීමට එතුමාට වාසනාව ලැබිණි. අන්තිම රාත්‍රි භෝජනය පිළියෙල කිරීම පිණිස යවනු ලැබුවේද පේදුරු තුමා සමග මෙතුමාය. මේ අවස්ථාවේ ගෝලයන්ගෙන් බාලයාවුද, සමිඳුන්ගේ ආදරවන්ත ගෝලයාවුද මෙතුමා සමිඳුන්ට තුරුල්ව සිටිමේ අවස්ථාවද ලැබුණි. ඒ හැර කිතු සමිඳුන් පාවා දුන් රාත්‍රියෙහි ජේසු තුමන්ගේ ආදරවන්ත ගෝලයාට කයිපස් නම් පූජකයාගේ මාලිග ාවට යාමට අවසර ලැබුනි. ජේසු තුමා කුරුසියෙහි දුක් විඳිද්දි ගෝලයන් දොලොස් දෙනාගෙන් කුරුසිය පාමුල සිටි එකම ගෝලයා වු එතුමාට සමිඳුන් විසින් තම මෑණියන් භාර කරන ලදි. සමිඳු සිරුර භූමදානයට සූදානම් කළ එකම ගෝලයාද මෙතුමා විය.

ශුද්ධාත්ම ආගමනයෙන් පසු පේදුරු තුමා සමග දේව මාළිගයේ යාච්ඥාවට ගිය මෙතුමා එදිනම සවස කොර මිනිසා සුව කිරීමේ ප්‍රාතිහාර්යය සිදු කළේය. ක්‍රිස්තුන් වහන්සේගේ බලය ඔවුන් තුළින් ප්‍රකාශ වූ නිසා කුපිත වූ අධිරාජයා උතුරන තෙල් කටාරමක දමා එතුමා මරන්න තැත් කළද එතුමාට ඉන් කිසිම හානියක් නොවීය. ඉන්පසු ''පැට්මොස් '' නම් ස්ථානයට පිටුවහල් කරනු ලැබූ එතුමා''එළිදරව්'' නැමැති පොත ලියන ලද අතර කිතු තුමන්ගේ ආදරය ගැන අවසානය දක්වාම දේශනා කළේය. සිරගතව සිටියදී පවා දේව දූතයකුගේ විශේෂ මග පෙන්වීමකින් සිර ගෙයින් එළියට ගෙනෙන ලද පේදුරු තුමා හා ජුවාම් තුමා යන දෙදෙනා තම ශ්‍රාවකයින් අතරට ගොස් ක්‍රිස්තුන් වහන්සේ නිසා දුක් විඳිමේ ගෞරවයත් , බැහැපත් වීමේ අවස්ථාවත් ලැබීම ගැන ප්‍රීතිය හා සතුට බෙදා ගත්හ. එතුමා පේදුරු තුමා කැටුව සමරියාවේ පවුල් බැහැදැකීමටද සහභාගි විය. ප්‍රේමයේ අපෝස්තුලුවරයා යන විරුදාවලිය ලද එතුමාගේ අවසන් වදන් වුයේද ''දරුවෙනි එකිනෙකාට ප්‍රේම කරන්න. වචනයෙන් නොව ක්‍රියාවෙන් හා සත්‍යයෙන් ප්‍රේම කරන්න'' යනුයි. අවසානයේදී තමන් මරණයට පත් කිරිමට තැත් කළ දොමිසියානු අගරජුගේ මරණින් පසු එපිසියට හැරි ආවේය. මහලු වනතුරු එහි ජීවත් වූ එතුමා ගෝලයන් අතරින් අන්තිමට මියගිය තැනැත්තාය. එතුමාගේ මංගල්‍යය දෙසැම්බර් 27 දින සමරනු ලබයි.

**අසේල දසනායක**

## ප්‍රහේළිකා අංක 41

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | ■ |
| | ■ | | ■ | 4 | 5 |
| | ■ | 6 | 7 | | |
| 8 | 9 | ■ | | ■ | |
| ■ | | ■ | ■ | 10 | ■ |
| ■ | 11 | | | | ■ |

### හරහට

1. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වීමට ......... හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක, මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. ශුද්ධවූ සභාවේ පනත් සංඛ්‍යාව

6. දෙවිපියාණන් අපට දී ඇති හැකියාවන් වර්ධනය කර දේව රාජ්‍යය වෙනුවෙන් යෙදවිය යුතු බව පෙන්වීමට ..... දසය පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. තම ....සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරු වන්නේය. යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

11. අග්‍රදූතයන්ගෙන් එක් කෙනෙකි.

### පහළට

1. සදොම් සහ ගොමෝරා නුවරවල් .... වලක්වාලීමට ආබ්‍රහම් තුමා දෙවිපියාණන් ඉදිරියේ මැදිහත් විය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

2. ක්‍රිස්තුන් වහන්සේ සිදුකළ විවිධ ප්‍රාතිහාර්යයන් නිසා උන්වහන්සේ පිළිබඳ පුවත...... පැතිරී ගියේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ගිනිගත් නොදැවෙන පඳුර මැදින් දෙවිඳුන් මෝසෙස්ට කථා කරමින් ''ඔබේ පාද වලින් ..... ගලවා දමන්න''. ඔබ සිටින ස්ථානය ශුද්ධ භූමියෙකැ'යි වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

5. ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ග රාජ්‍යයේ ..... ශු. පේදුරු තුමාට පැවරූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. බදු පොළේ සිටි මෙම අයකැමියාට ක්‍රිස්තුන් වහන්සේ ''මා අනුව එන්න ''යයි වදාළ සේක.

9. කානා නුවර විවාහ මංගල්‍ය අවස්ථාවේදී ක්‍රිස්තුන් වහන්සේ මේවා මිදි යුෂ බවට හැරවූ සේක.

10 මේවා ගසා මරා දැමීම සඳහා පව්කාර ස්ත්‍රීය මිනිසුන් විසින් ක්‍රිස්තුන් වහන්සේ වෙතට ගෙන ආවේය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 5/27,18, 9/11 ශු. මාක් 1/40 , ශු. ජුවාම් 8, උපදේශකයා හෙවත් සිරාක් 3/6, උත්පත්ති18/16, නික්මයාම 3/5

සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර



**කටාන, මඩම්පැල්ල දෙව් මැදුරට අයත් සන්තියාගු මුනිදු පෙර පාසලේ දරු දැරියන් විසින් පැවැත්වූ ළමා පොළ ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන්වී තිබූ අයුරු. එච්.ඒ. කල්දේරා**

**ඔබේ දහම් පාසල ගැන අපිට ලියලා එවන්න ...**

**ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්ය මණ්ඩලය හා සිසු නායකයින්ගේද සේයාරූ සමඟ අප වෙත යොමු කරන්න.**

**අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය,**

**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
චිත්‍රකථා රචනය
34
ආනන්ද කල්දේරා
දෙබස් හා චිත්‍ර: ඒ.ස්.පී.පී. සරුආරච්චි
මම ඊශ්‍රායෙල් වහලුන්ට ඊජිප්තුවෙන් පිටවයාමට ඉඩ නොදෙමි.. තමුන්ලාට හැකි දෙයක් කරපල්ලා.. මම ඒකට බය නෑ.. තොපලා දෙදෙනා වහා.. මෙතනින් පිටවී යනු
මාළිගාවෙන් එළියට පැමිණි මෝසෙස් හා ආරොන්
මෝසෙස් අපි දැන් මොකද කරන්නේ.. පාරාවෝ අපි කියන දෙයක් පිළිගන්නෙ නැහැනේ..
පාරාවෝ උදෑණම ස්නානයට එනවා... අපි හෙට උදේම මාළිගාව අසල නයිල් නදිය වෙත යමු.....
පසුදා... මෝසෙස් හා ආරොන් රජ මාළිගාය අසලින් ගලායන නයිල් නදිය වෙතට පැමිණා...
..රජතුමනි..
ආ..මේ ඊශ්‍රායෙල් වරු දෙදෙනා අද මෙතනටත් ..ඇවිත්..
මොනවද උඹලට.. ඕනි... ...කියාපල්ලා...
රජතුමනි..! ඔබ තවම දෙවියන් වහන්සේගේ අණට කීකරු වෙලා නැහැ.. අපේ සෙනගට ඊජිප්තුවෙන් පිටවීමට අවසර ..නොදෙන්නේනම් ..උන්වහන්සේගේ බලය පෙන්නාවි..
නෑ... මම.. එකඟ නැහැ.. තුමලාගේ.. ..කීම් වලට.. වහාම මෙතනින්.. පලයව්..
එහෙනම් මේ නයිල් නදියේ ජලය ලේ බවට ..හැරේවි..
ඕ!



ළමා ප්‍රදීපය















## ගවහලේ කථාව රාගම පුදබිමේ

කොළඹ අගරදගුරු පදවියේ සදහම් සජීවක මෙහෙවර විසින් පදවිය වෙනුවෙන් සංවිධානය කරන්නට යෙදුණු ගවලෙන් තරඟය සඳහා ඉතා අලංකාර හා අර්ථවත් ගවලෙන් විශාල සංඛ්‍යාවක් සාදා නිමකර තිබූ අතර ඒ තුළින් සමිඳුන්ගේ උපතට විශ්වාසයේ අර්ථයන් ලබා දී ඒ තුළින් සමාජයට විවිධ පණිවුඩයන් ලබාදී තිබුනා. මෙහි දැක්වෙන්නේ එම ගවලෙන් තරඟයේ විශේෂ අවස්ථා කිහිපයක් හා නිමකර තිබූ ගවලෙන් කිහිපයක්.

ඡායාරූප : අෂේන් එස්. සේනාරත්න




